21/12/2010 - ලංකාදීප

**විනය සංගායනාවක් පැවැත්වීම රටේ කාලීන අවශ්‍යතාවක් - මිලින්ද මොරගොඩ**

ජාත්‍යන්තර සමාජයේ කැළඹිලිවල අවසානයක් නැත. කාලගුණය, පරිසරය සිට ත්‍රස්තවාදය හා යුධ ගැටුම් දක්වා මෙම ප්‍රශ්න විශාල පරාසයක් පුරා විසිරී යයි. ආර්ථික අර්බුද, ස්වභාවික ව්‍යසන හා අනේකවිධ ගැටලු මැද ගමන් කරන ලෝකය නැවුම් දර්ශනයක් ඉල්ලා සිටින බව පෙනෙන්නට තිබේ. තාක්ෂණය විසින් තොරතුරු හුවමාරුව හා දැනුම වර්ධනය උදෙසා අපමණ සේවාවක් කරනු ඇතැයි අපේක්ෂා කරයි. එනමුත් වෙබ් අඩවි භාවිතා කරමින් අද ජාත්‍යන්තර සමාජය තුළ වාර්තාවන විවිධ සිදුවීම් පෙන්නුම් කරන්නේ එහි තවත් අනතුරුදායක පැතිකඩකි.

ත්‍රස්තවාදය අවසන් කිරීම සමග ශ්‍රී ලාංකේය ජන සමාජය ද අවතීර්ණ වී ඇත්තේ ප්‍රබෝධජනක අවස්ථාවකටය. ඝන අන්ධකාරයේ සිට දීප්තිමත් ආලෝකයක් ඇති සැනසිලිදායක මොහොත අත්විඳින වත්මන් සමාජය එහි අසිරියෙන් ප්‍රීති වෙති. මෙම පරපුරට දැන් අවශ්‍යව ඇත්තේ නව දර්ශනයකි. එනමුත් වර්තමාන සමාජය තුළ වෙනත් කථිකාවතක් තිබේ. මේ කථිකාව තුළ ඇත්තේ තර්කයකි. තර්කයෙහි එක පාර්ශ්වයක් වී ඇත්තේ ජාත්‍යන්තර ප්‍රජාව නිෂ්ප්‍රයෝජනය. අවශ්‍ය නැත. අපට අපේ ශක්තියෙන් තනිව ගමන් කළ හැකිය යන්නයි. දෙවැනි පාර්ශ්වය කියන්නේ ජාත්‍යන්තර බැඳීම් රහිතව තනි ගමනක් රටකට තිබිය නොහැකි බවයි. සත්‍යය ඇත්තේ මේ තර්ක දෙක අතර බව පැහැදිලිය. උදා වූ අවස්ථාවෙන් ප්‍රයෝජන ගෙන අනාගතය සාක්ෂාත් කර ගත යුත්තේ තනිවම ද නැතිනම් ලෝක ප්‍රජාව සමග එකතුවීමෙන් ද යන කාරණාවට සාධාරණ විනිශ්චයක් අවශ්‍යය.

ජාත්‍යන්තර සමාජයේ අර්බුද, රටට අවශ්‍ය වී ඇති අලුත් අවස්ථාව හා ඒ වෙනුවෙන් දර්ශනයක් ගොඩනගා ගැනීම ඉදිරියේ අපට අතිශයින් වැදගත් මොහොතක් උදා වී තිබේ. එය 2600 වැනි සම්බුද්ධත්ව ජයන්තියයි. ''පිළිවෙතින් පෙළ ගැසෙමු'' යන අනගි පාඨය පදනම් කරගනිමින් ලබන 2011 වසරේ වෙසක් පුන් පොහෝ දිනයේ දී එ සම්බුද්ධත්ව ජයන්තිය සමරන්නට ශ්‍රී ලාංකේය ජන සමාජය සූදානම්ය. හුදෙක් මෙය ආගමික සංකේතයක් වශයෙන් සැලකීමට වඩා පිළිවෙතින් පෙළ ගැසීම සමස්ථ රටවැසියාගේම අවශ්‍යතාවයක් බව තේරුම් ගැනීම වැදගත්ය. ධර්මය, හා අදහන සංකල්ප වෙනස් නමුත් යහපත් දේ වෙනුවෙන් මෙරට සමාජය එකතුවීම සුදුසුය. මෙරට ගිහි සමාජයත්, සංඝ සමාජයත් ඉතා සංකීර්ණ පසුබිමක පවතින මෙම අවස්ථාවේ දී මහා සංගායනාවක් පවත්වා සම්බුද්ධත්ව ජයන්ති උත්සවයේ ගම්භීරත්වය වර්ධනය කරගන්නට පියවර ගතහොත් මැනවැයි යන්න මාගේ අදහසයි. මෙම සංගායනාව ධර්මයේ ඇති සත්‍ය ගවේෂණයකට වඩා විනය සංගායනාවක් වශයෙන් පැවැත්වීමට යෝජනා කිරීම වඩාත් සුදුසුය.

වර්තමානයේ දී බුද්ධ ධර්මයට හා එහි ගැබ්ව ඇති දර්ශනයට ජගත් ප්‍රජාවගේ වැඩි අවධානයක් හිමි ව ඇත. පසුගිය වසර ගණන තිස්සේ ලෝකවාසීහු ක්‍රමයෙන් බුද්ධ දේශනාව කෙරෙහි ආකර්ෂණය වෙමින් සිටිති. බුද්ධ ධර්මය තර්කයේ සීමාවන් ඉක්මවා යන ප්‍රායෝගික දර්ශනයකි. තොරතුරු තාක්ෂණ යුගයට ගැළපෙන යථාර්ථවාදී ආගමක් බව ලෝකවාසීන් විසින් පිළිගෙන ඇත. සිත, කය හා වචනය සංවර කරගෙන මැදුම් පිළිවෙතකට අනුව ගිහි ජීවිතය ගත කරන අන්දම ගැනත් අවසානයේ නිවන ළඟා කර ගැනීම සඳහා ගත යුතු පැහැදිලි මාර්ගයත් බුද්ධ දේශනාවේ සඳහන්ය. බලහත්කාරයට වඩා යථාවබෝධය වැදගත් සාධකයක් බව මේ අනුව පැහැදිලිය. එය ඇදහිල්ලක් නොවේ. බුද්ධ දේශනාව තුළ ඇත්තේ යම් ජනවර්ගයකට සීමා නොවෙන පොදු, සදාකාලික දර්ශනයකි. ධර්මයට අනුගතව ජීවත්වීම හා සියලු දේ තමන් විසින්ම තර්කකර, විමසා බලා එය තමන්ට ගැළපේ ද යන්න නුවනින් විමසා බැලීමට එහි අවස්ථාව තිබීම වැදගත් සේ සැලකිය යුතු කරුණකි.

වර්තමානයේ අප මුහුණ පා සිටින අර්බුදවලට හේතුව කුමක්ද? සමාජයේ විනය හා විශ්වාසය පිරිහීමයි. ආණ්ඩු හා එහි පනවන ලද නීති රීති බිඳ වැටී ඇත. අවංකත්වය, ගෞරවය, මධ්‍යස්ථභාවය වැනි ජනසමාජය ගරු කරන වටිනාකම් නැවතත් ඇති කිරීම ප්‍රශ්නයක් වී ඇත.

නීතියට පමණක් සියල්ල කරන්නට හැකියාවක් නැත. ශ්‍රී ලංකාව ඇතුළු බටහිරට යටත්ව සිටි රටවල් රැසක් මේ අවාසනාවන්ත තත්ත්වයේ බරපතළ ගොදුරු බවට පත්ව තිබේ. ඇතැම් රටවල් අධිරාජ්‍යවාදීන්ගේ ග්‍රහණයට දීර්ඝ කාලයක් යටත් ව සිටීමෙන් ස්වකීය අනන්‍යතාව සොයා ගැනීම අපහසු වී ඇත. රටවල්වල වෙසෙන ජනතාවගේ කැමැත්ත හෝ පිළිගැනීම අනුව පැවති පරිපාලන රටාව වෙනුවට අද පවතින්නේ බටහිර විසින් පනවන ලද පාලන ක්‍රම ය. යම් යම් සංශෝධන තිබිය හැකිය. එනමුත් මූලික රාමුව නොවෙනස්ය. අධිරාජ්‍යවාදීන් විසින් ඔවුන්ගේ පහසුව සඳහා ඇති කරන ලද පරිපාලන රටා ලෝකයේ රටවල් විශාල ගණනක තවමත් ක්‍රියාත්මක වෙයි.

බුදු දහමෙන් රාජ්‍ය පාලනය පිළිබඳව දැක්මක් දී තිබේ. මධ්‍යස්ථව ජීවිතය ගත කිරීම සඳහා ගත යුතු මාවත ද බුද්ධ දේශනාවේ ඇතුළත්ය. බෞද්ධාගම පවතින රාජ්‍යයන්ට බුද්ධ දේශනාවේ දර්ශනය හරය සේ ගෙන ගැළපෙන පරිපාලන රටාවක් සකස් කර ගත හැකිය. බටහිර පනවන ලද නීති රීති තවදුරටත් පවත්වාගෙන ආර්ථික, ත්‍රස්තවාද හා සමාජ ප්‍රශ්න බොහෝ ප්‍රමාණයකින් මිරිකී සිටින වත්මන් සමාජයේ පෙර පැවති උසස් ධර්මතා අලුත් රාමුවකින් අනුගමනය කරමින් සමාජ ප්‍රශ්න විසඳා ගන්න උත්සාහ කළ යුතුය. බටහිර පනවන ලද න්‍යාය විසින්, ප්‍රශ්න ඇති කර ඒවා අර්බුද බවට පත් කර තිබේනම්, පෙරදිග කලාපයෙන් ලෝකයට ගෙන ගිය මැදුම් පිළිවෙත පදනම් කරගත් අලුත් සමාජ පාලන රාමුවක් සකස් කර ගැනීම කෙරෙහි අප අවධානය යොමු කළ යුතුය. එය කළ හැකිය. අවශ්‍ය වන්නේ ඒ වෙනුවෙන් නිර්භීතව ඉදිරිපත් වී වෙනසක් ඇති කළ හැකි බව පෙන්වා දීමයි.

බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්මයේ ඇතුළත් ආර්ථික හා දේශපාලන න්‍යායයන් වර්තමාන සමාජයට උකහා ගත හැකිය. දීඝනිකායේ චක්‍රවර්ති සීහනාද සූත්‍රයේ දුරාචාරය හා සොරකම් ඇතුළු කාරණා දුප්පත්කම නිසා ඇති වන බව පෙන්වා දෙයි. වර්තමානයේ සිදුවන්නේ දඬුවම් මගින් අපරාධ මැඩපවත්වන්නට උත්සාහ කිරීමයි. එහෙත් දීඝනිකායේ කූට දන්ත සූත්‍රයේ මේ සඳහා ගත යුතු පියවර පෙන්වා දී ඇත. මහජනතාවගේ ආර්ථික තත්ත්වය නංවා දුප්පත්කමින් මුදවා ගැනීමෙන් මේ තත්ත්වය මග හරවා ගත හැකි බව බුදුරජාණන් වහන්සේ සිය දේශනාවේ පෙන්වා දී තිබේ. බිය හා සැකය තුරන් වූ සමාජයකින් සාමය ද, අපරාධ අඩු වීමක් ද දැකගත හැකි බව බුදුරජාණන් වහන්සේ පෙන්වා දී ඇත. දුප්පත්කම නැති කරන්නට බුද්ධ දේශනාවෙන් ලබා දුන් දර්ශනය තේරුම් ගැනීම වර්තමාන ලෝකයේ පවතින ගැටලුවලට ඇති යුක්ති සහගත සාධාරණ විසඳුමක් නොවේද?

තවත් අවස්ථාවක උපයන ධනය පරිභෝජනය, නැවත ආයෝජනය හා මතු අවශ්‍යතා වෙනුවෙන් ඉතිරි කරන අන්දම බුද්ධ දේශනාවෙන් පෙන්වා දී තිබේ. මෙම ධර්මානුකූල පිළිවෙතට ඇතුළුවී සිටින්නට හැකි වූයේ නම් අද සමාජයට ආර්ථිකය බරපතල ගැටලුවක් නොවේ.

මෙකී දර්ශනය ජාත්‍යන්තර ප්‍රජාව හමුවේ තබන්නට නම් වත්මන් සංඝ සමාජයට පුළුල් ශක්තියක් අවශ්‍යය. දෙදහස් හයසිය වැනි සම්බුද්ධත්ව ජයන්තිය සමරන මේ අවස්ථාවේ බුදු දහමට ගරු කරන, ඒ අනුව ජීවිතය සකස් කරගෙන සිටින අප අවංකවම අපගේ ශක්තිය ගැන නිසි තක්සේරුවකට යා යුතුව ඇත. සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය හා සමස්ත බෞද්ධ ජනතාවට ආගමික දර්ශනය බෙදා දීම උදෙසා එකමුතු විය යුතුය.

සිවිල් සමාජය හා සමානව සංඝ සමාජයේ ද නොයෙක් බෙදීම් ඇති බව පෙනෙන්නට තිබේ. අඩු ලුහුඬුකම් හා ශාසන හිතකාමී නොවන සිදුවීම් වාර්තා වෙයි. බෞද්ධාගමේ පමණක් නොව, වෙනත් ආගම්වල ද කලින් කල මෙවැනි පිරිහීම් හා පිබිදීම් දැක ගත හැකිය. රටට ශක්තියක් වී ඇති, ලෝකය පුරා විහිදෙමින් පවතින බුද්ධ දර්ශනය ප්‍රභාවත් කිරීම වෙනුවෙන් නිසි තීන්දුවලට එළැඹීමේ වගකීමක් ත්‍රෛනිකායික මහ නාහිමිවරු ප්‍රධාන මහා සංඝරත්නයට ඇත. බුද්ධ ශාසනයේ පරිහානියට හේතු වී ඇති බව පෙනුණ අවස්ථා ගණනක දී සංඝාධිකරණය හා කතිකාවතක් ඇතිකිරීම මගින් නිවැරදි මගට අවතීර්ණවීම අරබයා සුසංවාදයක් බිහිවිය. එනමුත් ඒවායේ සාරගර්භ යෝජනා ප්‍රායෝගිකව ක්‍රියාත්මක වූ බවක් පෙනෙන්නට නැත. ගිහි සමාජය මෙකී යෝජනා හා සංවාද මහත් උපෙක්ෂා සහගතව බලා සිටින අතර එමගින් වසර දහස් ගණනක සමාජ පරිණාමය සමග ධර්මයට මුසුවූ නොයෙකුත් අවභාවිතා නිවැරදි වනු ඇතැයි අපේක්ෂා කරති. එහි වරදක් නැත. සද්ධර්මයේ ශක්තියක් දක්වන්නට නිවැරදි පිළිවෙතක පිහිටිය යුතුය.

මහා විනය සංගායනාවකට අප යා යුත්තේ ඇයි? සම්බුද්ධත්ව ජයන්තිය සමරන මේ කාල පරිච්ඡේදය එයට ගැළපෙන්නේ ද? යන සාධාරණ ප්‍රශ්න වලටත් පිළිතුරු සැපයිය යුතුය.

ඉතිහාසය අනුව බුදුරජාණන් වහන්සේ පරිනිර්වාණයට පත්වීම සමග මාර්ග ඵල අවබෝධකරගෙන නොසිටි සංඝරත්නය අතර ඇතිවූ ශාසනික ගැටලු පළමු ධර්ම සංගායනාවට හේතු විය. විනය පිටකයට අයත් චුල්ල වග්ගය එය සඳහන් කරන්නේ සුභද්‍ර නම් හිමි නමක්, බුදු රජාණන් වහන්සේගේ පරිනිර්වාණය සමග ලින් අපට උපදෙස් දෙන්නට කෙනෙක් නැත. අපට රිසි දේ කළ හැකිය යනුවෙන් ප්‍රකාශ කරන ලද අතර එයින් පසු මහා සංඝරත්නය විසින් සංඝ සමාජයේ පැවැත්ම අභියෝගයනට ලක්වන ලකුණු දැක මහා කාශ්‍යප මහ රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් පළමු සංගායනාව පවත්වන ලද බවය. දෙවනුව බුදු රජාණන්වහන්සේගේ පිරිනිවන් පෑමෙන් සියවසරකට පසුව ද, තෙවැන්න මොග්ගලී පුත්තතිස්ස මහ රහතන්වහන්සේගේ ප්‍රධානත්වයෙන් පාටලී පුත්ත නගරයේ දී ද පැවති බව මහාවංශයෙහි සඳහන්ය.

කරුණු ගවේෂණය කරන විට මේ දක්වා ධර්ම සංගායනා දොළහක් පවත්වා ඇති අතර එයින් අවස්ථා තුනක් ශ්‍රී ලංකාවේ දී පවත්වා තිබීම සුවිශේෂය. මෙකී සංගායනා අතුරින් හතරවැන්න අනුරාධපුරයේද, හත්වැන්න පොළොන්නරුවේ ද හා නැවත අටවැන්න ශ්‍රී ලංකාවේ ද පවත්වා ඇත. අනුරාධපුර මහා විහාරය ආශ්‍රිතව පවත්වන ලද සංගායනාවේ දී මෙරටට ගැළපෙන අන්දමට ධර්මය සීහළ අට්ඨකථා මගින් අවබෝධය පිණිස ඇති කරන්නට පියවර ගත් බව ලික්වේ. පොලොන්නරුවේ පැවති සංගායනාවේදී මහායාන හා ථෙරවාද බෙදීම් හා ග්‍රාමවාසී හා අරණ්‍ය වාසී සංඝරත්නය සම්බන්ධ කතිකා පැනනැගී ඇති බව දැක්වේ. අවසන් සංගායනාව බුරුමයේ රැන්ගුන් නුවර දී බුදු රජාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් වසර 2500 ක් ගතවූ 1954 මැයි මාසයේ පවත්වා ඇත. බුරුම රාජ්‍යයේ මහා සංඝයා වහන්සේ පන්සිය නමක් හා ශ්‍රී ලංකාව, ඉන්දියාව, තායිලන්තය, කාම්බෝජය, ලාඕස් හා පකිස්තානය යන රටවලින් ද මහා සංඝරත්නය මෙම දොළොස්වැනි මහා ධර්ම සංගායනාවට සහභාගී වී තිබේ. පන්සියයක් හිමිපාණන් වහන්සේලා ත්‍රිපිටකය දේශනා කරන විට තවත් එවැනි ම මහා සංඝරත්නයක් විසින් එහි දෝෂ පරීක්ෂාකර සම්මුතියකට බැසගෙන ඇත. එමගින් අපේක්ෂා කර ඇත්තේ පිරිසිදු සම්බුද්ධ දේශනාව තවදුරටත් ආරක්ෂා කර ගැනීමයි. මෙම මහා කාර්ය භාරය 1954 වසරේ ආරම්භ කර 1956 වසරේ වෙසක් පොහොය දිනය දක්වා පැවතීමෙන් හා ඒ සම්බන්ධව ගිහි පැවිදි බෞද්ධ ජනතාව දක්වා ඇති උනන්දුවෙන් පෙනී යන්නේ ශ්‍රී සද්ධර්මය සුරක්ෂිතව පවත්වාගෙන යෑම සඳහා පවතින අසීමිත උත්සාහයයි. එවකට නොයෙකුත් බාධක හා බලපෑම් ශ්‍රී සද්ධර්මය අවිච්ඡින්නව පවත්වා ගෙන යෑමට එරෙහිව මතුවී තිබේ. ධර්ම සංගායනාවට මුල්වී ඇත්තේ එකී පරිහානීය හේතු මැඩ යළි පුනර්ජනනීය ශක්තිය ලබා ගැනීමයි. එය සාර්ථක වූ බවට සැකයක් නැත.

වර්තමානයේ බුද්ධ ශාසනය අභියෝගයකට ලක්ව නැතැයි කිව නොහැකිය. බෞද්ධ විරෝධී බලවේග හා බුද්ධ ශාසනයේ පැවැත්මට බලපෑ කරුණු සොයා බලන්නට කොමිසමක් ද පත්කර සාක්ෂි විමසා එහි වාර්තාවක් නිකුත් කර ඇත. ප්‍රායෝගිකව බලන විට දිවයින පුරා පිහිටි විහාරස්ථාන නොයෙකුත් අපහසුතාවන්ට මුහුණ දී ඇත. සසුන් ගතවන නවක හිමිපාණන් වහන්සේලා සංඛ්‍යාවෙන් සීමාසහිතවීම පමණක් නොව ධර්ම ශාස්ත්‍රීය ගවේෂණයෙන් අග තැන්පත්වන්නට වර්තමාන තරුණ හිමිපාණන් වහන්සේලා උනන්දු නොවීම ද මහා ශාසනික ගැටලුවකි.

සමාජ බෙදීම්, පිරිහීම් වළකා ගැනීමේ අරමුණ ඇතිව සංඝරත්නය දේශපාලනයට අවතීර්ණවීමත් අනතුරුව මහ මැතිවරණයට ඉදිරිපත්වීමත් දක්වා ගමන් කිරීම ගැනත් සමාජයේ විවිධ අදහස් තිබේ. විද්‍යාව හා තාක්ෂණයේ දියුණුව සංඝ සමාජය තුළටත් ඇතුළු වී ඇත. සමාජ දියුණුව සමග මහා සංඝරත්නය නොයෙකුත් වෘත්තීන් හි නියැලෙයි. දැනුමෙන් පොහොසත් වන අතරතුර ඒ දැනුම යළි මහජනතාවට බෙදා දෙන ආකාරය ගැන ගැටලු තිබේ. ඇතැම් හිමිපාණන් වහන්සේලා විශේෂයෙන් අරණ්‍යගත භික්ෂු වහන්සේලා බහුතරයක් අදටත් මුදල් පරිහරණය නොකරති. ගසකින් අත්තක් පවා කඩා නොදමති. එළවලු, පළතුරු හා ධාන්‍ය මගින් පමණක් යැපෙන සංඝයා වහන්සේලා ද සිටිති. මේ අතර බුදු රජාණන් වහන්සේ විසූ යුගයට හාත්පසින් ම වෙනස් ලෞකික දේ සමාජයේ පරිහරණය වෙමින් තිබේ. දුරකථනය, පරිගණකය, යාන වාහන, රූපවාහිනී හා ගුවන් විදුලි යන්ත්‍ර මෙයින් සමහරකි. සංඝරත්නයට මෙවැනි දේ අකැප ද? කැප වන්නේ කෙසේ ද? යන්න විනය කතිකාවතකින්

සාකච්ඡා කළ හැකිය. මෙරට ඇතැම් වෙහෙර විහාරස්ථාන මලයාලි ගුරුකම් හා යකැදුරුකම් කරන මධ්‍යස්ථාන බවට පත්ව තිබේ. කේන්දර බැලීම් යන්ත්‍ර මන්ත්‍ර කටයුතු වල නිරත වීම් යනාදී වශයෙන් මහා සංඝරත්නය නිරත විය යුතු යැයි බොදු ජනතාව අපේක්ෂා නොකරන අංශ කෙරෙහි අවතීර්ණ වී තිබේ. තවත් තැනෙක වෘත්තීය විහාරස්ථානයේ ඉඩ කඩ වෙන්කරගෙන එහි නොයෙකුත් බාහිර ව්‍යාපාර හා අධ්‍යාපන සේවා පවත්වන අවස්ථා දැක ගත හැකිය. නීති වෘත්තියට ඇතුළුවීම හා රියදුරු බලපත්‍ර ලබා ගැනීම යනාදී ගිහි සමාජයට සීමා වූ අංශ කෙරෙහි ඇතුල් වන්නට භික්ෂූන් වහන්සේලා යෝජනා කරති. මේවා සුදුසුද? නුසුදුසු ඇයි? සුදුසුනම් එය කළ හැකි පිළිවෙත කුමක්ද? විමසා බැලිය යුතුය.

බුදු රජාණන් වහන්සේ කාලීනව, ධර්ම විනායානුකූලව භික්ෂුවගේ පැවැත්ම වෙනස් ගත හැකි ආකාරය ගැන පැහැදිලිව දේශනා කර තිබේ. අර්බුදයක් පැන නැගි අවස්ථාවක එයට මුහුණ දෙන්නේ කෙසේ ත්‍රිපියි එදවසට ගැළපෙන පරිදි දක්වා ඇත. විහාර හා දේපොල පවත්වා ගැනීම, දායක කාරකාදීන් සමග පවත්වන සම්බන්ධතා හා පාලකයාගේ සිට සාමාන්‍ය පුද්ගලයා දක්වා බලය නොව ගුණය අනුව උස් මිටි තැන් හඳුනා ගත හැකි අන්දම පැහැදිලිව දේශනා කොට තිබේ. සමාජය සංකීර්ණ හා අවශ්‍යතා වෙනස් වූ විට මේවාට මුහුණ දෙන්නේ කෙසේද? මේවා එකිනෙකට වෙනස් මතභේදාත්මක කරුණුය.

ශාසනික පැවැත්ම, විහාරස්ථානයන්හි පවතින අඩුපාඩු සම්බන්ධව ද නොයෙකුත් අදහස් මතුවී ඇත. නගරබද විශාල වශයෙන් සම්පත් ඇති දායක සභා ඇති විහාරස්ථාන හා ඉතා දුර බැහැර දාන වේල සපයා ගැනීමට ද දුෂ්කර විහාරස්ථාන ගැන ද නොයෙකුත් විවේචන ඉදිරිපත්ව තිබේ. වඩා බැරෑරුම් හා විශාල අවධානයකට ලක්විය යුත්තේ බුද්ධ ධර්මය නොයෙකුත් බාහිර සාටෝප එකතු වී එහි යථාවබෝධයට වඩා බාහිරාලංකාරය කෙරෙහි අවධානය යොමුවීම ගැනය. බුද්ධ දේශනාවේ හරය යටපත්වී එහි මතුපිට සරල ආගමික හැඟීම පමණක් ඉදිරියට ගෙන එන ආකාරය පිළිබඳවය.

මිහිඳු මාහිමියන් මිහින්තලාවට වැඩමකර අලුතින් ලාංකික සමාජයට බෙදූ දුන් ත්‍රික්ම රටට අනන්‍ය කර ගන්නට අපි සමත් වීමු. ශ්‍රී ලාංකේය අනන්‍යතාව සමග වර්තමානයේ බුදු දහම ජාත්‍යන්තරයට යොමු කරන්නට ද අපි සමත්ව සිටිමු. බුදුරජාණන් වහන්සේ වැඩ සිටි බිමටත් වඩා බුදු හිමියන්ගේ දැක්ම හා භාවිතාව දක්නට ලැබෙන්නේත් ආරක්ෂා වී ඇත්තේත් ශ්‍රී ලංකාවේය. එය සුවිශේෂී කාරණාවකි. සත්‍යයට මුහුණ දෙන්නටත්, එය සමාජයට ගැළපෙන ලෙස යථාර්ථවාදී පදනමක් ලෙස සකස් කරගැනීමේ අභියෝගයටත් අතීතයේ දී අප සාර්ථකව මුහුණ දී ඇත. බුද්ධ දේශනාව අනුව වෙනස් කරන ලද ඇවතුම් පැවතුම්, සමාජ විනය හා සංස්කෘතික ලක්ෂණවලට සමාජය ඔරොත්තු දී තිබේ.

යථාර්ථය හඳුනාගෙන නව දැක්මක් බිහි කරන්නට පමණක් නොව එය සාර්ථකත්වය සේ හුවා දක්වා බුදු දහම සේම මෙරට දැක්ම තවත් සමාජයකට පදනමක් සේ පිරිනමන්නට හැකි යුගයක් වෙනුවෙන් අලුතින් සිතන්නට අවශ්‍යය. අභියෝගය බවට පත්ව ඇත්තේ සුපිරිසිදු නිර්මල බුදු දහම තවත් දෙදහස් පන්සිය වසරක් පවත්වාගෙන යාමය. ඒ උදෙසා වරින්වර පවත්වන සංගායනා මහෝපකාරීවන බව නිසැකය. ධර්මයෙහි සැක පලුදු තැන් නිරාකරණය කරගෙන, විශේෂයෙන් විනය හා ඇවතුම් පැවතුම් සම්බන්ධයෙන් පොදු සිද්ධාන්ත ගොඩ නගා ගැනීමට එවැනි යාන්ත්‍රණයක් අවශ්‍යය. සම්බුද්ධත්ව ජයන්තිය මේ සියලු කාරණා විද්වත්ව විමසිල්ලෙන් සාකච්ඡා කරන්නටත් ඒ වෙනුවෙන් සංවාදයක් ගොඩනගන්නටත් සුදුසුම කාලසීමාවයි. උත්සව සැරසිලි අවශ්‍යය. බොහෝ විට අප යමක් සැමරීම වෙනුවෙන් උවමනාවටත් වඩා උත්සව පවත්වා කාලයත්, ධනයත් වැය කරන්නට සමත්ය. සම්බුද්ධත්ව ජයන්තිය වෙනුවෙන් පොත පත සකස් වී රාජ්‍ය අනුග්‍රහය සැලසීම අගනේය. එයට වඩා අවශ්‍ය වන්නේ මෙම දෙදහස් හයසිය වැනි සංවත්සරය නිමිත්තෙන් සදාකාලිකව සිහිකළ හැකි යම් සත් කාර්යයකට දායකවීමයි. බෞද්ධ සමාජයේ ඉදිරි පැවැත්ම උදෙසා මහා විනය සංගායනාවක් කැඳවීම එහිලා ඉතාමත් වැදගත් කාර්යයයි. මෙම සංගායනාව අපගේ පැවිදි පක්ෂයේ හා ගිහි පක්ෂයේ විනයගරුකබව හා එහි පැවැත්ම සම්බන්ධව අලුත් ආකාරයකට සිතා බලන අවස්ථාවක් විය යුතුය.

මෙයට අමතර වශයෙන් මෙරට ශාසනික පැවැත්ම සම්බන්ධයෙන් ඉදිරි දර්ශනයක් ද ගිහි පැවදි අප සියලු දෙනාටම තිබීම අත්‍යවශ්‍යය. වසර දහයකට පසු ශ්‍රී ලාංකේය සමාජයේ අනන්‍යතාව කුමක්ද? මෙරට බුද්ධ ශාසනයේ පැවැත්ම කෙබඳු විය යුතුද යන්න අපි දැන් සිටම කරුණු සැලසුම් කළ යුතු වෙමු. ගෞරවණීය මහා නායක හිමිපාණන් වහන්සේලාගේ උපදෙස් මත දැනුම් තේරුම් ඇති ධර්මධර සංඝයා වහන්සේලාගෙන් හා වියත් ගිහි පිරිසක් විශේෂ කමිටුවක් වශයෙන් එකතු වී, සාකච්ඡා කර ක්‍රියාකාරී සැලැස්මක් යෝජනා කළ යුතුය. විවිධ අන්දමට බෙදී ඇති පාර්ශව සියල්ල නියෝජනය කෙරෙන අන්දමට මෙකී රාමුව සකස් කර ගතහොත් මෙරට සම්බුදු ශාසනයේ කීර්තිය වැඩි දියුණු වනු ඇත. එය ජාතික සමගියටත් රටට මහත් ශක්තියක් ද වන බව නොඅනුමානය. මෙම කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තිය සැමරීමේ නියම අරුත තහවුරු කිරීමකි.